සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

8 ශ්‍රේණිය | **සිංහල භාෂාව හා සාහිත්‍යය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- 1 - 20 දක්වා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

01. ''පන්සලට පැමිණි අපරාධකරු බොරු සීලයක් පෙන්වමින් කටයුතු කළේය.
(i) ඇඟිලි ගනිමින් (ii) කිඹුල් කඳුළු හෙළමින්
(iii) අන්තිම ඉත්තත් අදිමින් (iv) බක තපස් රකිමින්

02. ''ඉතා ම ළඟින් සිට හතුරුකම් කිරීම'' යන අදහස දෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.
(i) කොරේ පිටට මරේ (ii) අඟේ ඉඳන් කන කනවා වගේ
(iii) එකට කෑවත් බොක්ක වෙනස් ලු (iv) ඉබ්බා කට නිසා නැහුණා වගේ.

03. පහත දී ඇති යුගළ පද වල හිස්තැනට අදාළ පද පිළිවෙලින් ඇති පිළිතුර තෝරන්න.
★ අඩුම - ..... ★ ..... - පීඩන ★ ළමයි - ..... ★ ..... - කුද
(i) තාඩන, බමයි, ඇද, කුඩුම (ii) ඇද, කුඩුම, බමයි, පීඩන
(iii) කුඩුම, තාඩන, බමයි, ඇද (iv) බමයි, ඇද, තාඩන, කුඩුම

04. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(i) වර්ණය, ලේකම්, මර්දනය, මුර්ධඡ (ii) ශිෂ්ඨාචාරය, පරිඝණකය, සංගායනාව, ලේකම්
(iii) අර්බුධ, ශිෂ්ටාචාරය, වර්නය, මුර්දඡ (iv) මර්ධනය, පරිගණකය, වර්නය, ලේඛම්

05. ගෙම්බා උභයජීවී සත්ත්වයෙකි. මෙහි ඉරිගසා ඇති පදයේ අර්ථය වන්නේ,
(i) ගොඩබිම පමණක් වසන (ii) දියෙහි උපදින
(iii) වනයේ වාසය කරන (iv) දියගොඩ දෙකෙහිම වසන

06. නිවැරදිව විරුද්ධාර්ථ පද සහිත පද පේළිය තෝරන්න.
(i) මඟුල - අවමඟුල, වරද - නොවරද, සම - නිසම, කුසල් - අකුසල්
(ii) පැහැ - අවපැහැ, වරද - නිවරද, සම - අසම, කුසල් - අකුසල්
(iii) කුසල් - නොකුසල්, කෙලෙස් - නිකෙලෙස්, අවුල් - වියවුල්, වරද - නිවරද
(iv) ලත් - නොලත්, දුන් - නොදුන්, කරන - නොකරන, කුසල් - නිකුසල්

07. යම්කිසි උද්ධෘත පාඨයක මුලින් හෝ මැදින් හෝ අගින් කොටසක් අත්හරින ලද බව පෙන්වීමට යොදන විරාම ලකුණ වන්නේ,
(i) සරල වරහන (()) (ii) සඟල වරහන ({}) (iii) තනි කොමාව (,) (iv) තිත්පෙළ (.....)

08. උක්ත පද දෙකක් හා අනුක්ත පද දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(i) ශිෂ්‍යාවක්, ළමයෙක්, දරුවෙකු, මගියෙක් (ii) ළමයි, මිනිස්සු, කුරුල්ලෝ, ගවයෝ
(iii) දරුවෝ, කුරුල්ලෝ, මිනිසුන්, ගවයන් (iv) ක්‍රීඩකයන්, ළමයින්, ගවයන්, මිනිසුන්

09. අනියමාර්ථ නාම පද පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(i) කතක, ලේඛිකාවක, මිනිසෙක්, ගැහැනියක් (ii) මිනිස්සු, ගැහැනු, කතුන්, කතක්
(iii) දරුවන්, මිනිසෙකු, දරුවෙකු, ගවයෙකු (iv) ගුරුවරයා, ශිෂ්‍යයා, බල්ලා, කුරුල්ලා

Past Papers Wiki

10. එකිනෙකට සමානාර්ථ පද පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(i) ඕලු, ඇඹුල, ශාලුක, නෙලුම්
(ii) නේත්‍ර, නයන, අක්ෂි, නෙත්
(iii) නෙලුම්, පියුම්, ඕලු, සියපත්
(iv) හිරු, දිනකර, තාරපති, දිනපති

11. ලොකු අම්මා සුදුසාරියකින් සැරසී අවමගුල් පෙරහැරේ ශෝකයෙන් ගමන් කළා ය. මෙම වාක්‍යයේ ඇතුළත් විශේෂණ පද සහිත පිළිතුර වන්නේ,

(i) ලොකු, සුදු, අවමගුල්, ගමන්
(ii) අම්මා, සාරිය, පෙරහැරේ, ශෝකයෙන්
(iii) ලොකු, සුදු, අවමගුල්, ශෝකයෙන්
(iv) අම්මා, සාරිය, අවමගුල්, ගමන්

12. ''ලෙඩින් දුකින් සංහතියම මැරීයන්'' , ''බල සුබ නිමිති පෙරමග නැකතටත් වැඩී''
ඉහත කවි පද වල ඉරි ගසා ඇති පද අයත් ක්‍රියා පද වර්ගය පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(i) ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(ii) ආශිර්වාද ක්‍රියා, විධි ක්‍රියා
(iii) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා
(iv) විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා

13. කෘදන්ත නාම පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) ගස්වැල්, මඳ සුළඟ, කිරිබත්, ගම්වැසි
(ii) රන්මුවා, සෙල්මුවා, බලවත්, ධනවත්
(iii) නටන්නා, ගයන්නා, වයන්නෝ, ලියන්නෝ
(iv) ඇත්දළ, පන්සිල්, බලවත්, ධනවත්

14. පහත ඇති වාක්‍ය අතරින් නිවැරදි වාක්‍ය තෝරන්න.

(i) නුඹ ගමට යන්නෙහු.
(ii) නුඹලා පාඩම් කළෙහු.
(iii) ඔහු ප්‍රදර්ශනය නැරඹුවෙහි.
(iv) ඈ ගීයක් ගැයුවේ ය.

15. පහත වාක්‍ය අතරින් වැරදි වාක්‍ය තෝරන්න.

(i) මිනිස්සු කුඹුර වපුරති.
(ii) මම චාරිකාවක් යමි.
(iii) අපි හෙට පාසලට ගියෙමු.
(iv) දරුවෝ සෙල්ලම් කරති.

16. නිවැරදි පද බෙදීමේ රීතියට අනුව සංඛ්‍යාවාචී පදයක් නිවැරදිව ලියා ඇති පිළිතුර තෝරන්න.

(i) එකසියවිසිපහ (ii) 100 ක් (iii) 60 කට (iv) දෙසීය විසිපහ

17. නිවැරදි අකාරාදී පිළිවෙළ සහිත පද පේළිය තෝරන්න.

(i) කතරගම, කාගම, කොටහේන, කෙසෙල්වත්ත
(ii) කිරින්ද, කොස්ගම, කෝවාන, කටුකුරුන්ද
(iii) ගලහිටියාව, ගාල්ල, ගිරිඋල්ල, ගෝනගම
(iv) වැවගම, වීරපොකුණ, වේරහැර, වැත්තෑව

18. හෙළයේ මහා ගත්කරු ලෙස හඳුන්වන්නේ,

(i) වීදාගම මෛත්‍රී හිමියන් ය.
(ii) ඇස්. මහින්ද හිමියන් ය.
(iii) ගුණදාස අමරසේකර මහතා ය.
(iv) මාටින් වික්‍රමසිංහ මහතා ය.

19. ලෝ වැඩ සඟරාව ලියූ කතුවරයා සහ යුගය නිවැරදිව යෙදී ඇති පිළිතුර වන්නේ,

(i) වීදාගම මෛත්‍රී හිමි - කෝට්ටේ යුගය
(ii) වීදාගම මෛත්‍රී හිමි - පොළොන්නරු යුගය
(iii) තොටගමුවේ රාහුල හිමි - කෝට්ටේ යුගය
(iv) තොටගමුවේ රාහුල හිමි - දඹදෙණි යුගය

20. පරාස්ස නාට්‍යය රචනා කළේ,

(i) එදිරිවීර සරත්චන්ද්‍ර මහතා ය.
(ii) ගුණදාස අමරසේකර මහතා ය.
(iii) මහගමසේකර මහතා ය.
(iv) රෝහණ දන්දෙණිය මහතා ය.

(ලකුණු 2 x 20 = 40)

II - කොටස

- **1, 2 හා 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු ලියන්න.**

01. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.
   (i) සිංහල රාජධානී සමයට අයත් ගිලී ගිය නෞකාව සොයාගත් වරාය කුමක් ද?
   (ii) 'සිරි ලංකා රටම අපී' ගීතය නිර්මාණය කළ රචකයාගේ නම ලියන්න.
   (iii) පරාස්ස නාට්‍යයේ චරිත 02 ක් නම් කරන්න.
   (iv) ''කටුවානෙන් කෙටුවා වැනි කොළේ හැටී
   රතු නූලෙන් ගෙතුවා වැනි මලේ හැටී
   තුන්මස පිරෙන විට කුකුළෙකු විතර ඇතී
   සාරමසට පැසෙනා ගෙඩි කියන් සකී''
   මෙම තේරවිලි කවියෙන් කියවෙන දේ කුමක් ද?
   (v) පරිසර හිතකාමී කඩදාසි නිෂ්පාදනය සඳහා යොදාගත් ඉවත දමන අමුද්‍රව්‍ය කුමක් ද?

(ලකුණු 2 × 5 = 10)

02. පහත ඇති මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200 කට නොඅඩු රචනයක් ලියන්න.
   (i) මරු කැඳවන රිය අනතුරු.
   (ii) මත්‍රකුසාගෙන් ගැළවෙමු.
   (iii) මුහුදු පතුළේ කිමිදුනෙමි.
   (iv) වනපෙතක අසිරිය.
   (v) අනගාරික ධර්මපාලතුමා.
   (vi) නිරෝගී දිවියකට අපේ ආහාර පුරුදු.

(ලකුණු 20)

03. ඔබේ පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා / නායිකාව ඔබ යැයි සිතන්න. දිනෙන් දින වැඩිවන මාර්ග අනතුරු වලින් ආරක්ෂා වීම සඳහා පාසල් සිසුන් දැනුවත් කිරීමේ දේශනයක් සඳහා පොලිස් රථවාහන අංශයේ නිලධාරී මහතෙකු ඉල්ලා පොලිස්පතිතුමාට යවන රාජකාරී ලිපිය ලියන්න. මෙහිදී ලිපිය විදුහල්පතිතුමා මගින් යොමුකරන ආකාරයට ලිවිය යුතුය.

(ලකුණු 10)

04. ඔබේ පෙළ පොතේ ඇතුළත් පහත උද්ධෘත ඇසුරෙන් විමසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   (i) ළිප ගිනි මොළවන තෙක් දිය සැළියේ
   සැපයක් යැයි කකුළුව දිය කෙළියේ
      (අ) මෙම කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?
      (ආ) මෙම කවිපද වලට අනුව කකුළුවාට ඊළඟට සිදුවිය හැක්කේ කුමක් ද?
   (ii) ''මට කීර්ති ප්‍රශංසා ඕනෑ නෑ. මං ඒව බලාගෙන වැඩ කරන්නෙත් නෑ.''
      (අ) මෙම ප්‍රකාශය අයත් පාඩම කුමක් ද?
      (ආ) මෙම ප්‍රකාශය කළේ කවුද?
   (iii) ''මේ මිනිහ මොන යකා හොයන්ඩ ගියාද මන්ද?''
      (අ) මෙම ප්‍රකාශය අයත් පාඩම කුමක් ද?
      (ආ) මෙම ප්‍රකාශය කරන්නේ කවුද?
   (iv) ''ඔබ හැමදාම මා අසල ම ඉන්න. කෘත්‍රිම නයිට්ංගේල්ව මා කුඩු පට්ටම් කරන්නම්.''
      (අ) මෙම ප්‍රකාශය අයත් පාඩම කුමක් ද?
      (ආ) මෙම ප්‍රකාශය කරන්නේ කවුද?
   (v) ''මොකද විඩක් ඕනද?''
      (අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද?
      (ආ) මෙසේ අසන්නේ කාගෙන් ද?

(ලකුණු 2 × 5 = 10)

Past Papers Wiki

05. පහත දී ඇති වාක්‍යවල හිස්තැනට ගැළපෙන පද යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) අරුණෝදයේ පද්මයෝ ..... (පිබිදෙයි / පිබිදෙති)

(ii) කුරුලු රංචු අහසේ පියාසර ..... (කරයි / කරති)

(iii) ගොවියා ..... දක්කයි. (ගවයෝ / ගවයන්)

(iv) ..... මුවන් මරයි. (කොටියා / කොටියෝ)

(v) ඔවුහු ..... දුටුවෝ ය. (අපි / අප)

(vi) මව ..... පෝෂණය කළා ය. (දරුවෝ / දරුවන්)

(vii) නුඹලා ඊයේ පාසලට ..... (ගියෙහු / ගියහ.)

(viii) ..... ගීයක් ගැයුවේය. (ගායිකාව / ගායකයා)

(ix) වැද්දෝ ..... දඩයම් කරති. (කුරුල්ලෝ / කුරුල්ලන්)

(x) සොරු ..... බය කර මුදල් පැහැර ගත්තෝ ය. (මිනිස්සු / මිනිසුන්)

(ලකුණු 1 × 10 = 10)

06. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලෝකය විශ්ව ගම්මානයක් බවට පත්කිරීමේ දී වැදගත් සාධකය වන්නේ දුරකතනයයි. මුල්ම වරට දුරකතනය සොයා ගනු ලබන්නේ ස්කොට්ලන්ත ජාතික ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් නම් අග්‍රගණ්‍ය විද්‍යාඥයා ය.

ඔහුගේ මව හා පියා චිත්‍රශිල්පීන් වූ අතර මව සංගීත ශිල්පිනියක ද වූවා ය. ඇය උපතින් බිහිරි වූ අතර පියා චිත්‍ර ආධාරයෙන් බිහිරි අයට ඉගැන්වීම ද කළේ ය. ඉගෙනීමෙහි ඉහළ දක්ෂ නොවූ බෙල් ක්ෂේත්‍ර චාරිකා වල නිරත වෙමින් විවිධ උපකරණ හැදීම අත්හදා බැලුවේ ය. ඒ අත්දැකීම් ඇසුරෙන් ඔහු මුලින් ම නිර්මාණය කළේ තිරිඟු ඇට වල පොත්ත ඉවත් කරන යන්ත්‍රයකි.

1876 මාර්තු මස 10 වන දින බෙල්ගේ ජීවිතයේ අතිශයින් ම වැදගත් දිනයක් විය. කාමර දෙකක සිට තම මිතුරා වූ වොට්සන් සමග කම්බි ආධාරයෙන් අදහස් හුවමාරු කර ගත්තේ ය. එය දුරකතනයේ ආරම්භය යි. වයස අවුරුදු 27 දී ශබ්දය විදුලිකම්බි දිගේ යැවීමේ මූලධර්මය සොයා ගත් අතර වයස අවුරුදු 29 දී ඒ සඳහා පේටන්ට් බලපත්‍රය ලබා ගත්තේ ය.

(1) දුරකතන සොයාගත් විද්‍යාඥයාගේ නම හා උපන් රට කුමක් ද?

(2) ඔහු මුලින් ම සොයාගත් උපකරණය කුමක් ද?

(3) බෙල්ගේ ජීවිතයේ අතිශයින් ම වැදගත් දිනය කුමක් ද?

(4) එම දිනය වැදගත් වීමට බලපෑ සිදුවීම කුමක් ද?

(5) දුරකතනය සඳහා පේටන්ට් බලපත්‍රය ලබා ගන්නා විට ඔහුගේ වයස කීයද?

(ලකුණු 1 × 10 = 10)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

පිළිතුරු පත්‍රය - I කොටස

(01)	iv	(02)	ii	(03)	iii	(04)	i	(05)	iv	(06)	ii	(07)	iv	(08)	iii
(09)	i	(10)	ii	(11)	iii	(12)	ii	(13)	iii	(14)	ii	(15)	iii	(16)	iv
(17)	iii	(18)	iv	(19)	i	(20)	iv								

(ලකුණු 2 x 20 = 40)

II කොටස

01. (i) ගොඩවාය වරාය
(ii) මහගමසේකර මහතා
(iii) පුංචිරාල, පුරංසිනා, කාලහීෂණ, පූර්ණක (ඕනෑම දෙකක්)
(iv) අන්නාසි ගෙඩිය
(v) අලි වසුරු

02. සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.
(අත් අකුරු, උක්ත ආඛ්‍යාත, මාතෘකාවට අදාළ වැදගත් කරුණු, වචන ප්‍රමාණය පිළිබඳ අවධානය යොමු කරන්න.)

03. සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න. රාජකාරි ලිපියේ මූලිකාංග මෙන්ම අක්ෂර වින්‍යාසය තොරතුරු වල පැහැදි බව පිළිබඳව අවධානය යොමු කරන්න.

04. (i) (අ) ලෝ වැඩ සඟරාව
(ආ) වතුර රත්වන විට මරණයට පත් වේ
(ii) (අ) බොදු පුනරුදයේ සෙන්පතියාණෝ
(ආ) මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි
(iii) (අ) පරාස්ස නාට්‍යය
(ආ) පුරංසිනා
(iv) (අ) සැබෑ ලෙන්ගතු කම / නයිටිංගේල්
(ආ) අධිරාජයා
(v) (අ) අවුරුදු සිහිනය
(අ) පියසේනගෙන්

05. (i) පිබිදෙති
(ii) කරති
(iii) ගවයන්
(iv) කොටියා
(v) අප
(vi) දරුවන්
(vii) ගියෙහු
(viii) ගායකයා
(ix) කුරුල්ලන්
(x) මිනිසුන්

06. 1. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් - ස්කොට්ලන්තය
2. තිරිඟු ඇටවල පොතු ඉවත් කරන යන්ත්‍රය
3. 1876 මාර්තු මස 10 වන දින
4. තම මිතුරා වූ වොට්සන් සමඟ කම්බි ආධාරයෙන් අදහස් හුවමාරු කර ගැනීම.
5. වයස අවුරුදු 29 යි.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank